ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: HRC/P/i/25/01/23

## මාධ්‍ය නිවේදනය

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටින අපේක්ෂකයින්ගේ අධ්‍යාපන අයිතියට බාධාකාරී තත්වයක් දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන විදුලි කප්පාදුව ඔස්සේ ඇති වී ඇති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට නිරීක්ෂණය වන බැවින්, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ සභාපතිවරයා 2023.01.25 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කැඳවන ලදි.

ඒ අනුව ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ සභාපතිවරයා, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු, සහ ලංකා විදුලිබල මණ්ඩලයේ ඉහළ නිලධාරීන් කිපදෙනෙකු අද දින සාකච්ඡාවට සහභාගී විය.

මෙම සාකච්ඡාවේදී මතු වූ ගැටළු සම්බන්ධව කඩිනම් මැදිහත්වීමක් අත්‍යාවශ්‍ය බැවින් අද දින (2023.01.25) පස්වරු 04.00 ට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් හදිසි සාකච්ඡාවක් සඳහා පහත ආයතනයන් කැඳවා ඇත. ඒ අනුව මෙම සාකච්ඡාව සඳහා ලේකම් - විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, සභාපති - ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව, සභාපති - ලංකා විදුලි බල මණ්ඩලය, සභාපති - ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, සභාපති - ලංකා බැංකුව සහ සභාපති - මහජන බැංකුව. කැඳවා ඇත.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2023.01.25

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

2023.01.25

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date

01 ලේකම්
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය .

02 සභාපති
ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව.

03 සභාපති
ලංකා විදුලි බල මණ්ඩලය

04 සභාපති
ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

05 සභාපති
ලංකා බැංකුව

06 සභාපති
මහජන බැංකුව

**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ විදුලි සැපයුම බාධාවකින් තොරව ලබාදීම සම්බන්ධවයි**

උක්ත කරුණ සම්බන්ධව **අද දින පෙ.ව.10.30** (2023 ජනවාරි මස 25) පැවති විමසීමෙන් අනතුරුව වඩිදුර කරුණු සාකච්ඡා කර තීරණයක් ගැනීම සඳහා ***පස්වරු 04 00 ට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 06 වන මහලේ*** **පැවැත්වෙන සාකච්ඡාව සඳහා ඔබගේ සහභාගීත්වය අත්‍යවශ්‍ය බැවින්** ඒ සඳහා පැමිණෙන ලෙස මෙයින් දන්වා සිටිමි.

මෙම දැනුම්දීම කරනුයේ 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ බලතල ප්‍රකාරව වේ.

රංජිත් උයන්ගොඩ,
ලේකම්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

රන්ජිත් උයන්ගොඩ
ලේකම්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk